සියලු ම හිමිකම් ඇවිරිණි /முழுப் பதிப்புரிமையுடையது /All Rights Reserved]

නව නිර්දේශය/புதிய பாடத்திட்டம்/New Syllabus

NEW

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2019 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2019 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2019

චිත්‍ර කලාව I
சித்திரக்கலை I
Art I

**51 S I**

2019.08.07 / 0830 - 1140

පැය තුනයි
மூன்று மணித்தியாலம்
Three hours

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time - 10 minutes

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේ දී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.

**උපදෙස්:**

විභාග අංකය : ......................................

* මෙම ප්‍රශ්න පත්‍රය කොටස් **දෙකකින්** සමන්විත ය.

**I කොටස**
- ප්‍රශ්න **සියල්ලට ම** පිළිතුරු **මෙම ප්‍රශ්න පත්‍රයේ ම සපයන්න.**
- එක් එක් ප්‍රශ්නයට නිවැරදි පිළිතුර තෝරා, එහි **අංකය** ඉදිරියෙන් ඇති **තිත් ඉර මත** ලියන්න.

**II කොටස**
- අනුකොටස් **තුනකින්** සමන්විත ය.
 **'අ'** කොටසින් ප්‍රශ්න දෙකක් හා **'ආ'** සහ **'ඉ'** යන කොටස් දෙකෙන් **එක්** ප්‍රශ්නය බැගින් තෝරාගෙන, ප්‍රශ්න **හතරකට** පිළිතුරු සපයන්න.

* **I** කොටසට හා **II** කොටසට අයත් පිළිතුරු පත්‍ර එකට අමුණා භාර දෙන්න.

| පරීක්ෂකගේ ප්‍රයෝජනය සඳහා | |
|---|---|
| **I පත්‍රය සඳහා** | |
| කොටස | ලකුණු |
| I | |
| II | |
| එකතුව | |
| 1 වැනි පරීක්ෂක | 2 වැනි පරීක්ෂක |
| | |


## I කොටස

● ප්‍රශ්න අංක **1** සිට **5** තෙක් ප්‍රශ්නවලට **වඩාත් යෝග්‍ය පිළිතුර** පහත සඳහන් **A, B, C, D, E** ලෙස නම් කර ඇති කැටයම් ඇතුළත් පින්තූර ඇසුරෙන් තෝරන්න.


A


B


C


D


E

**1.** **A** අක්ෂරයෙන් දැක්වෙන ලී කැටයම දක්නට ලැබෙනුයේ,
 (1) කුරුණෑගල ආසන්නයේ පිහිටි අම්බලමක ය.
 (2) ඇම්බැක්ක දේවාලයේ ය.
 (3) වෙල්ලායක පිහිටි ටැම්පිට දෙවොලක ය.
 (4) දෙවියන් උදෙසා පුද පූජා පැවැත්වෙන දෙවොලක ය.
 (5) පනාවිටිය ප්‍රදේශයේ පිහිටි අම්බලමක ය. (.........)

**2.** **B** අක්ෂරයෙන් දැක්වෙනුයේ,
 (1) යාපහුව රජ මාළිගයේ ද්වාර මණ්ඩපයේ පාදමේ පනේල අතර දක්නට ඇති පුවරු කැටයමකි.
 (2) මහනුවර දළදා මාළිගයේ පඩිපෙළ දෙපස දක්නට ඇති කැටයමකි.
 (3) යාපහුව දළදා මාළිගයේ පාදමේ බොරදම් තීරු අතර ඇති නර්තන රූප සහිත පනේලයකි.
 (4) ගඩලාදෙණිය විහාරයේ පාදමේ ඇති නටන වයන කාන්තා රූප සමූහයකි.
 (5) ලාලිත්‍යමය ස්වරූපයෙන් යුත් නාටිකාංගනාවන්ගෙන් සමන්විත යාපහුව පනේල කැටයමකි. (.........)

[දෙවැනි පිටුව බලන්න.

**3.** **C** අක්ෂරයෙන් දැක්වෙන භාරුත් කැටයමින් නිරූපණය වනුයේ,

(1) කාන්තාවක් පිළිබඳ චරිත කථාවකි. (2) බෝසත් චරිතයේ අවස්ථාවකි.
(3) ජාතක කථා පුවතකි. (4) මහාමායා දේවිය දුටු සිහිනයයි.
(5) බුද්ධ චරිතයේ සිද්ධියකි. (………)

**4.** **D** අක්ෂරයෙන් දැක්වෙන කැටයම,


(1) ඉන්දියාවේ එල්ලෝරාවේ දක්නට ලැබෙන්නකි.
(2) ඉන්දියාවේ වෙරළාසන්න පර්වතයක මුහුණතෙහි අල්පෝන්නතව නෙළා ඇත.
(3) ගංගානම් ගඟේ උපත දක්වන අයුරින් මහාබලිපුරම්හි වෙරළාසන්න පර්වතයක නෙලා ඇත.
(4) පිහිටි ගලක නෙළන ලද මිත්‍යා කථා පුවතකි.
(5) දෙවි, මිනිස්, සත්ත්ව රූ ඇතුළත්ව පර්වතයක නෙළා ඇත. (………)


**5.** **E** අක්ෂරයෙන් දැක්වෙන කුලුනු කැටයමින් නිරූපණය වනුයේ,

(1) ග්‍රීකයන් තම යුධ ජයග්‍රහණ සැමරීමයි.
(2) රෝමවරුන් තම යුධ ජයග්‍රහණ සැමරීමයි.
(3) රෝමවරුන් හා ග්‍රීකයන් අතර වූ යුද්ධ දර්ශනයයි.
(4) රෝම අධිරාජ්‍යයාගේ ජීවන තොරතුරුයි.
(5) රෝමවරුන් ඩේසියන්වරුන්ට එරෙහිව යුධ වැදුණු දර්ශනයයි. (………)


● ප්‍රශ්න අංක **6** සිට **10** තෙක් අසා ඇති ප්‍රශ්නවලට **වඩාත් යෝග්‍ය පිළිතුර** අංක 1 සිට 8 තෙක් නම් කර ඇති පහත සඳහන් චිත්‍ර කොටස් ඇසුරෙන් තෝරන්න.


1



2



3


4


5


6


7


8

**6.** උත්කීරණ (Engraving) ක්‍රමයට නිම කරන ලද රූපසටහන කුමක් ද?

(1) 1 (2) 2 (3) 3 (4) 4 (5) 7 (………)

**7.** ඍණ එලක (Negative print) ශිල්ප ක්‍රමය අනුව කරන ලද රූපසටහන කුමක් ද?

(1) 2 (2) 3 (3) 4 (4) 5 (5) 7 (………)

**8.** ලැස්කෝ ගුහාවේ දක්නට ඇති රූපසටහන් මොනවා ද?

(1) 1, 2 (2) 4, 6 (3) 6, 7 (4) 6, 8 (5) 7, 8 (………)

**9.** වර්ණාලේපිත ක්‍රමයෙන් නිර්මාණය කරන ලද ශ්‍රී ලාංකේය ගුහා රූපසටහන් මොනවා ද?

(1) 1, 2, 3 (2) 2, 3, 5 (3) 2, 3, 7 (4) 2, 5, 7 (5) 3, 5, 7 (………)

**10.** ශ්‍රී ලාංකේය ප්‍රාග් ඓතිහාසික යුගයේ රූපසටහන් මොනවා ද?


(1) 1, 2, 4, 5 (2) 1, 3, 5, 7 (3) 1, 5, 7, 8 (4) 2, 4, 6, 7 (5) 3, 4, 5, 6 (………)

[තුන්වැනි පිටුව බලන්න.


- ප්‍රශ්න අංක **11** සිට **15** තෙක් අසා ඇති එක් එක් ප්‍රශ්නයට **වඩාත් නිවැරදි පිළිතුර F, G, H, I, J** ලෙස නම් කර ඇති පහත සඳහන් චිත්‍ර ඇසුරෙන් තෝරන්න.


F


G


H


I


J

**11.** **F** අක්ෂරයෙන් දැක්වෙන, 'සීතා ද සේරම්' චිත්‍රය,
   (1) පුද්ගලවාදය පදනම් කරගෙන නිර්මාණය කළ සිතුවමකි.
   (2) පෙරදිග කලා රීතීන් අනුගමනය කරමින් කළ සිතුවමකි.
   (3) උපස්ථිතිවාදී කලා ලක්ෂණ මූලික කොට ගත් සිතුවමකි.
   (4) පශ්චාත් උපස්ථිතිවාදී චිත්‍ර සම්ප්‍රදායේ ලක්ෂණ නිරූපිත සිතුවමකි.
   (5) ශාස්ත්‍රාලයීය යථාර්ථවාදී චිත්‍ර සම්ප්‍රදායට අනුව කළ සිතුවමකි. (.........)

**12.** **G** අක්ෂරයෙන් දැක්වෙන ඉන්දීය සිතුවම නිර්මාණය කරන ලද්දේ කවුරුන් විසින්ද?
   (1) යුරෝපීය ශාස්ත්‍රාලයීය ලක්ෂණ භාවිත නොකළ රාජා රවි වර්මා ය.
   (2) ඉන්දීය ලක්ෂණ ගුරුකොට ගත් නන්දලාල් බෝස් ය.
   (3) යුරෝපීය පශ්චාත් උපස්ථිතිවාදී ආභාසය ලද අම්රිතා ෂර්ගිල් ය.
   (4) යුරෝපීය යථාර්ථවාදයට එරෙහිව සිතුවම් කළ අබනීන්ද්‍රනාත් තාගෝර් ය.
   (5) ඉන්දීය ජන කලා සම්ප්‍රදායන්ගේ ආභාසය ලත් ජෙමිනි රෝයි ය. (.........)

**13.** **H** අක්ෂරයෙන් දැක්වෙන 'අසංකාසුර සංහාරම්' චිත්‍රය පිළිබඳ **නොගැළපෙන** ප්‍රකාශය කුමක් ද?
   (1) බටහිර කලා සම්ප්‍රදාය අනුව ත්‍රිමාණ ලක්ෂණ දැක්වෙන සේ වර්ණ යොදා ඇත.
   (2) කතා කීමේ ශෛලියෙන් බැහැරව පෙරදිග කලා ලක්ෂණ සහිතව නිර්මාණය කර ඇත.
   (3) ශාස්ත්‍රාලයීය යථාර්ථවාදී කලා ලක්ෂණ කෝවිල් සිතුවම් කලාවට ගෙන ඒමට උත්සාහ දරා ඇත.
   (4) රාජා රවි වර්මාගේ කලා ශෛලියෙන් ආභාසය ලබා ඇත.
   (5) ඇන්ග්ලෝ ඉන්දියානු සාම්ප්‍රදායික ලක්ෂණ අනුව ගොඩනගා ඇත. (.........)


**14.** **I** අක්ෂරයෙන් දැක්වෙන 'එඩ්ගා ඩෙගාගේ' සිතුවම,
   (1) ශරීරයේ ආකෘතිය හා ආලෝකය අතර අන්තර් සබඳතාව නිරීක්ෂණය කර අඳින ලද්දකි.
   (2) සම්භාව්‍ය සංරචන ක්‍රමවේදයන්ගෙන් බැහැරව සිතුවම් කර ඇත.
   (3) කාලීන සිදුවීමක් පාදක කොටගෙන ඇත.
   (4) උණුසුම් හා ශීත වර්ණ ඇසුරින් නිර්මාණය කර ඇත.
   (5) උපස්ථිතිවාදයේ තිබූ සීමා අතික්‍රමණය කරමින් නිර්මාණය කර ඇත. (.........)

**15.** **J** අක්ෂරයෙන් දැක්වෙන සිතුවම නිර්මාණයේ දී 'වින්සන්ට් වැංගෝ' භාවිත කර ඇති ශිල්ප ක්‍රමය වන්නේ,
   (1) ප්‍රතිවිරුද්ධ වර්ණ චිත්‍රයේ තලය මත දී සංයෝජනය කිරීම ය.
   (2) තද කෙටි බුරුසු පහරවල් මගින් රිද්මය සහ චලනය දැක්වීම ය.
   (3) රාත්‍රි අහසේ නිසංසල බව සංයමයෙන් දැක්වීම ය.
   (4) ප්‍රතිවිරුද්ධ වර්ණ සංගත වන සේ ගළපා අහස නිරූපණය කිරීම ය.
   (5) ප්‍රකෘති ස්වභාවය වෙනුවට භාවමය සිතුවිල්ලක් සිතුවම් කිරීම ය. (.........)

More Past Papers at
tamilguru.lk

● ප්‍රශ්න අංක **16** සිට **20** තෙක් අසා ඇති එක් එක් ප්‍රශ්නයට **වඩාත් නිවැරදි පිළිතුර** පහත සඳහන් **K, L, M, N, O** ලෙස නම් කර ඇති මූර්ති ඇසුරෙන් තෝරන්න.


K


L


M


N


O

**16.** **K** අක්ෂරයෙන් දැක්වෙන පිළිමය,
(1) පොළොන්නරු ගල් විහාරයේ පිළිම අතුරෙන් එකකි.
(2) පොළොන්නරුවේ තන්ත්‍රයානික ලක්ෂණ පිළිබිඹු වන්නකි.
(3) පල්ලව ආභාසය මත කරන ලද ගල් විහාරයේ පර්වතය හාරා නිමවූවකි.
(4) ගල් විහාරයේ කේතු ආකාර, රශ්මාලාවක් සහිත පිළිම අතුරෙන් එකකි.
(5) ගල් විහාරයේ පර්වතය හාරා සකසන ලද විද්‍යාධර ගුහාවේ දක්නට ලැබෙන්නකි. (………)

**17.** **L** අක්ෂරයෙන් දැක්වෙන සමූහ මූර්තිය,
(1) ශිව පාර්වතී දේව දූතයකු සමග සිටින අයුරු නිරූපිත හින්දු ආගමික ලෝහ වාත්තු නිර්මාණයකි.
(2) කඳ කුමරුන් සහ පිරිවර ඇතුළත් හින්දු ආගමික පුවතක් නිරූපණය කරන්නකි.
(3) පොළොන්නරු ශිව දේවාලයෙන් හමු වූ ලෝකඩ වාත්තු මූර්තියකි.
(4) ශිව පාර්වතී සහ කඳකුමරු නිරූපිත මෙය ශිව සෝමස්කන්ධ ලෙස හැඳින්වේ.
(5) ශ්‍රී ලංකාවේ ලෝකඩ වාත්තු ශිල්ප ක්‍රමයේ විශිෂ්ටත්වය පෙන්වන නිර්මාණයකි. (………)

**18.** **M** අක්ෂරයෙන් දැක්වෙනුයේ,
(1) ඉන්දු නිම්නයෙන් හමු වූ මැටි මූර්තියකි.
(2) ආගමික ඇදහිලි හා විශ්වාස මත පදනම් වූ කල්පිත මූර්තියකි.
(3) ඉන්දු නිම්නයෙන් හමු වූ මව් දෙවඟන නිරූපිත ටෙරාකොටා මූර්තියකි.
(4) ඉන්දු නිම්නයෙන් හමු වූ මෙසපොතේමියානු ටෙරාකොටා මූර්තියකි.
(5) ප්‍රාථමික කලා ලක්ෂණ නිරූපිත සංකල්පීය මූර්තියකි. (………)

**19.** **N** අක්ෂරයෙන් දැක්වෙනුයේ,
(1) ගන්ධාර බෞද්ධ කලාවේ මුල් යුගයේ නිර්මිත බුදුරුවකි.
(2) දහම් දෙසන ආකාරයෙන් නෙළන ලද 'හෝර්ටිමන්දාර්' පිළිමයයි.
(3) ගන්ධාර නිර්මාණයේ ස්වාභාවික ලක්ෂණ නිරූපිත 'තක්තිබහීර්' පිළිමයයි.
(4) ගන්ධාරයේ බ්‍රෙගම් නම් ස්ථානයෙන් හමු වූ බුදු පිළිමයයි.
(5) බටහිර ශිල්පීන් ඉන්දීය සම්ප්‍රදායන්ට අනුව නෙලූ පිළිමයකි. (………)

**20.** **O** අක්ෂරයෙන් දැක්වෙනුයේ,
(1) හෙලනිස්ටික් යුගයේ බිහි වූ විජයග්‍රහණයේ දෙවඟන නම් වූ පිළිරුවයි.
(2) පියාපත් සහිත දේව දූතිකාවක් නිරූපිත ග්‍රීක ආකෘතියකි.
(3) ඉතා සියුම්ව අඟපසඟ හා වස්ත්‍ර මූර්තිමත් කර ඇති රෝම ආකෘතියකි.
(4) විජයග්‍රහණය සමරන දේවතාවියකගේ ඉරියව්වක් නිරූපිත මූර්තියයි.
(5) ග්‍රීසියේ ක්‍රීඩාවට අධිපති දෙවඟනගේ පිළිරුවයි. (………)

● ප්‍රශ්න අංක **21** සිට **25** තෙක් ඇති එක් එක් ප්‍රශ්නයට **වඩාත් නිවැරදි පිළිතුර** තෝරන්න.

**21.** කිසියම් කාර්යභාරයක් ඉටු කරන ආයතනයකට සුදුසු ලාංඡනයක් නිර්මාණය කිරීමේ දී,
(1) ඉතා අලංකාර පෙනුමෙන් යුතුව හැඩතල හා වර්ණ යෙදීම වැදගත් ය.
(2) ආකර්ෂණීය බවකින් හා මනා නිමාවකින් යුක්ත විය යුතු ය.
(3) ග්‍රැෆික් කලා මූලධර්මයන්ට අනුකූල විය යුතු ය.
(4) අර්ථය සන්නිවේදනය වන සේ සංකේතවත්ව හැඩ තල හා වර්ණ යොදා ගත යුතු ය.
(5) ද්විමානව පෝස්ටර් සායම් භාවිත කළ යුතු ය. (………)

**22.** කිසියම් තේමාවක් ව්‍යුක්තරූපීව සංරචනය කිරීමේ දී,
(1) යථාරූපී සංරචන විධි උපයෝගී කර ගත යුතු ය.
(2) වර්ණ හැසිරවීම ද්විමාන අයුරින් යෙදිය යුතු ය.
(3) හැඩතල රචනයේ දී ප්‍රාණපූර්ණ රේඛා භාවිත කළ යුතු ය.
(4) තේමාවට උචිතව නිර්මාණශීලී හැඩතල භාවිත කළ යුතු ය.
(5) යොදා ගන්නා ශෛලියට අනුරූපව රේඛා, හැඩතල සහ වර්ණ යෙදිය යුතු ය. (………)

**23.** ගෘහ අලංකරණය සඳහා අපතේ යන ද්‍රව්‍ය ඇසුරෙන් මූර්තියක් නිර්මාණය කිරීමේ දී සැලකිලිමත් විය යුත්තේ,
(1) විචිත්‍රත්වය හා චමත්කාරජනක බව රැකීමට ය.
(2) පාරිභෝගික අපේක්ෂාවන්ට අනුකූල වන පරිදි නිම කිරීමට ය.
(3) අමුද්‍රව්‍යයන් තමාට අභිමත පරිදි යොදා ගැනීමට ය.
(4) අමුද්‍රව්‍යයවල ස්වභාවයට වඩා නිර්මාණයේ අවශ්‍යතාව ගැන ය.
(5) භාවිතයට ගන්නා අමුද්‍රව්‍යයවල ගතිස්වභාවය කෙරෙහි ය. (………)

**24.** දෘශ්‍ය කලාවේ යථාර්ථ නිරූපණය (Realism) යනු,
(1) ශාස්ත්‍රාලයීය මූලික රීතීන් අනුගමනය කිරීමයි.
(2) පර්යාලෝක මූලධර්ම නිවැරදිව භාවිත කිරීමයි.
(3) ප්‍රශස්ත සෞන්දර්ය රීති මත මානව රූප නිරූපණය කිරීමයි.
(4) සොබාදහමේ පවත්නා ජීවී අජීවී වස්තූන්ගේ ස්වභාවය එලෙසින්ම නිරූපණය කිරීමයි.
(5) සෞන්දර්ය රීතීන්ට අනුකූලව සියල්ල නිරූපණය කිරීමයි. (………)

**25.** පරිගණකයක් ඇසුරින් සුබපැතුම් පතක් නිර්මාණය කිරීමේ දී අත්‍යවශ්‍ය වන්නේ,
(1) මූලික ආකෘතිය වර්ණ චිත්‍රයක් ලෙස ඇඳ ගැනීමයි.
(2) ග්‍රැෆික් නිර්මාණය සඳහා සුදුසු මෘදුකාංගයක් තෝරාගැනීම සහ එහි භාවිතය පිළිබඳ අවබෝධයයි.
(3) නිර්මාණයට අවශ්‍ය රූපසටහන් හා අක්ෂර තෝරා ගැනීමයි.
(4) සන්නිවේදනාර්ථ මතු වන පරිදි පරිගණකය තුළ නව ආකෘතියක් ගොඩනගා ගැනීමයි.
(5) සුබපැතුම් පතක පිටපතක් පරිගණකයට ඇතුළත් කර අමතර පිටපත් ලබා ගැනීමයි. (………)

- ප්‍රශ්න අංක **26** සිට **30** තෙක් ඇති එක් එක් ප්‍රශ්නයට **වඩාත් නිවැරදි පිළිතුර** තෝරන්න.

**26.** ගම්පොළ යුගයේ හමු වන බෞද්ධ වාස්තු විද්‍යා නිර්මාණ තුළින් පිළිබිඹු වනුයේ,
(1) දකුණු ඉන්දීය පල්ලව ගෘහ නිර්මාණ ලක්ෂණයි.
(2) විහාර අභ්‍යන්තරයට වඩා බාහිර බිත්ති අලංකාර කිරීමේ නැඹුරුවයි.
(3) ද්‍රවිඩ ශිල්පාචාරීන් විසින් භාවිත කරන ලද හින්දු වාස්තු විද්‍යා ලක්ෂණයි.
(4) පොළොන්නරුවේ දක්නට ලැබෙන හින්දු වාස්තු විද්‍යා ලක්ෂණයි.
(5) දකුණු ඉන්දීය විජයනගර් වාස්තු විද්‍යා ලක්ෂණයි. (………)

**27.** පහත සඳහන් ඒවායින් මහනුවර යුගයේ ශිල්පීන් පිළිබඳ නිවැරදි ප්‍රකාශය කුමක් ද?
(1) නීලගම සිත්තර පරම්පරාවේ ශිල්පීන් විසින් දඹුලු විහාරයේ සිතුවම් ඇඳ ඇත.
(2) මහනුවර සිතුවම් අතුරෙන් බොහොමයක් සිතුවම් ඇඳ ඇත්තේ සිත්තර නයිදේ ශිල්පියා විසිනි.
(3) දෙගල්දොරුව විහාරයේ සිතුවම් සියල්ල නිර්මාණය කරන ලද්දේ දෙවරගම්පල සිල්වත්තැන විසිනි.
(4) දේවේන්ද්‍ර මූලාචාරීන් වාස්තු විද්‍යාවට වඩා චිත්‍ර කලාවට දක්ෂයෙකි.
(5) දෙල්මඩ මූලාචාරීන් මහනුවර යුගයේ විසූ ශ්‍රේෂ්ඨතම චිත්‍රාචාර්යවරයා ය. (………)


**28.** ගන්ධාර දේශය තුළ බිහි වූ මථුරා කලාව,
(1) අපරදිග කලා ආභාසය මත බිහි වූවකි.
(2) ග්‍රීක බෞද්ධ මිශ්‍ර සම්ප්‍රදායකි.
(3) දේශීයත්වය පිළිබිඹු වන කලා සම්ප්‍රදායකි.
(4) කණිෂ්ක රජු විසින් හඳුන්වා දෙන ලද්දකි.
(5) මහායාන බෞද්ධ දර්ශනය අනුව බිහි වූවකි. (………)

**29.** බුදුරදුන් දම්සක් දෙසුම පැවැත්වූ ස්ථානය සිහිවීම පිණිස අසෝක රජු විසින් කළ නිර්මාණය කුමක් ද?
(1) ලෞරියා නන්දන්ගර් ස්ථම්භයයි. (2) රාම්පූර්වා ස්ථම්භයයි.
(3) සාංචි ස්ථම්භයයි. (4) සාරානාත් ස්ථම්භයයි.
(5) රුම්මින්දෙයි ස්ථම්භයයි. (………)

**30.** ඝනිකවාදය සඳහා පදනම් වී ඇත්තේ,
(1) කලා කෘතියෙන් මතුවන හැඟීම් ප්‍රකාශනයයි.
(2) වර්ණ භාවිතයේ සීමාවන් අතික්‍රමණය කිරීමයි.
(3) වස්තූන් තුළ සැඟවී ඇති මූලික ජ්‍යාමිතික හැඩ ගවේෂණය කිරීමයි.
(4) කල්පිත ලෝකය හා යථාර්ථය අතර අන්තර් සබඳතාව ගවේෂණය කිරීමයි.
(5) ත්‍රිමාණත්වය හා එළිය-අඳුර නිරූපණය කිරීමේ උත්සාහයයි. (.........)


● ප්‍රශ්න අංක **31** සිට **35** තෙක් ඇති එක් එක් ප්‍රශ්නයට, ඊට ඉදිරියෙන් ඇති වාස්තු විද්‍යා නිර්මාණ ඇසුරෙන් **වඩාත් නිවැරදි පිළිතුර** තෝරන්න.

**31.** මෙහි දැක්වෙන වාස්තු විද්‍යාත්මක නිර්මාණය වන්නේ,
(1) ශ්‍රී ලංකාවේ හමුවන විශිෂ්ටතම වටදාගෙයයි.
(2) පොළොන්නරුව දළදා මළුවේ වටදාගෙයයි.
(3) තිරියාය ප්‍රදේශයේ පිහිටි වටදාගෙයයි.
(4) නිස්සංකමල්ල රජු ඉදි කළ වටදාගෙයයි.
(5) ගල් තලාවක් මත ඉදි කර ඇති මැදිරිගිරිය වටදාගෙයයි.




(.........)

**32.** මෙහි දැක්වෙන පොකුණ ඉදිකර ඇත්තේ,
(1) තිසා වැව් තාවුල්ලේ ඇති උද්‍යානයක ය.
(2) විශිෂ්ට කලා ලක්ෂණ නිරූපිත රන්මසු උයනේ ය.
(3) ඉසුරුමුණි විහාරයේ ය.
(4) දේවානම්පිය තිස්ස රජු විසින් රාජකීයන් උදෙසා ය.
(5) අභයගිරි විහාර භූමියේ ය.




(.........)

**33.** මෙහි දැක්වෙන දෙවොල,
(1) ශිඛර දෙකකින් යුතුව මහබලිපුරම් වෙරළේ ඉදිකර ඇත්තකි.
(2) නැවියන්ට මුහුදේ සිට වන්දනා කිරීම සඳහා ඉදි කරන ලද්දකි.
(3) පල්ලව කලා ලක්ෂණ අනුව මහබලිපුරම් වෙරළේ ඉදි කරන ලද්දකි.
(4) මහබලිපුරම් වෙරළේ එකිනෙකට ආසන්නව ඉදි කර ඇත්තකි.
(5) පල්ලව රාජධානි යුගයේ චෝළයන් විසින් ඉදි කරන ලද්දකි.




(.........)

**34.** නයිල් මිටියාවතේ දක්නට ඇති මෙය,
(1) දෙවන රැමේසස් රජු විසින් ඉදිකරන ලද ලක්සෝර් දෙවොලයි.
(2) පර්වතය හාරා සැකසූ දෙවන රැමේසස් රජුගේ අබුසිම්බල් දෙවොලයි.
(3) මිසර සාම්ප්‍රදායික මූර්ති රැසක් දක්නට ඇති දෙවොලකි.
(4) තම යුධ ජයග්‍රහණ සිහිවීම පිණිස රැමේසස් රජු විසින් කළ එඩ්ෆු දෙවොලයි.
(5) අස්වාන් මිටියාවතේ ජලාශයට යට වී විනාශ වී ගිය අබුසිම්බල් දෙවොලයි.




(.........)

**35.** මෙහි දැක්වෙනුයේ,
(1) ඉන්දු නිම්නයේ හමු වන ගඩොලින් කළ ධාන්‍යාගාරයයි.
(2) ඉන්දීය පල්ලව රාජධානියේ රාජකීයන් උදෙසා ඉදි කළ ජල තටාකයයි.
(3) ඉන්දු නිම්නයේ හමු වන ජල අපවහන පද්ධතියේ මූලස්ථානයයි.
(4) ජලය පිදීම සඳහා හරප්පාවේ භාවිත කළ ස්ථානයයි.
(5) ඉන්දු නිම්න ශිෂ්ටාචාරයෙන් හමු වන ජල තටාකයයි.



(.........)

● ප්‍රශ්න අංක **36** සිට **40** තෙක් ඇති එක් එක් ප්‍රශ්නයට **වඩාත් නිවැරදි පිළිතුර** පහත සඳහන් චිත්‍රය ඇසුරෙන් තෝරන්න.



**36.** මෙම සිතුවම නිර්මාණය කරන ලද්දේ,
(1) 43 කණ්ඩායමේ ශිල්පියෙක් වූ මංජු ශ්‍රී ය.
(2) බටහිර ශිල්ප ක්‍රම ඇසුරෙන් විහාර සිතුවම් කළ එම්. සාර්ලිස් ය.
(3) විහාර සිතුවම්කරණයේ පෙරළිකාර ජෝර්ජ් කීට් ය.
(4) පෙරදිග කලා සම්ප්‍රදාය අනුගමනය කළ සෝලියස් මැන්දිස් ය.
(5) විහාර සිතුවම්කරණයේ නූතන විප්ලවය සිදු කළ සෝමබන්දු විද්‍යාපති ය. (………)

**37.** මෙම සිතුවමින් නිරූපණය වනුයේ,
(1) සිදුහත් කුමරුගේ විවාහ ගිවිස ගැනීමයි.
(2) සුද්ධෝදන රජ මැදුරේ සිදු වූ විවාහ මංගල්‍යයකි.
(3) සුද්ධෝදන රජු හා මහාමායා බිසවගේ විවාහ මංගල්‍යයයි.
(4) සිදුහත් කුමරුගේ හා යසෝදරාගේ විවාහ මංගල්‍යයයි.
(5) රාජමාලිගයක් තුළ සිදු වූ විවාහ මංගල්‍යයකි. (………)

**38.** මෙම සිතුවමේ,
(1) ස්වාභාවිකව හැඩතල සංකලනය වී ඇත.
(2) නිරූපණාත්මක හා ශෛලීගත හැඩ අර්ථවත්ව භාවිත කර ඇත.
(3) වියුක්තවාදී හා තාත්වික හැඩ නිර්මාණාත්මකව යොදා ඇත.
(4) යුරෝපීය ස්වාභාවිකවාදී චිත්‍ර සම්ප්‍රදායේ ලක්ෂණ අනුගමනය කර ඇත.
(5) ප්‍රකාශනවාදී චිත්‍ර සම්ප්‍රදායේ ලක්ෂණ මනාව භාවිත කර ඇත. (………)

**39.** මෙම සිතුවම නිර්මාණයේදී ශිල්පියා අනුගමනය කර ඇත්තේ,
(1) රිචඩ් හෙන්රිකස්ගේ යුරෝපීය ක්‍රමවේදයයි.
(2) රෆායෙල්ගේ පුනරුද කලාවේ ලක්ෂණයි.
(3) පෝල් සෙසාන්ගේ පශ්චාත් උපස්ථිතිවාදී ලක්ෂණයි.
(4) ක්ලෝඩ් මොනේගේ ගෘහස්ත ජීවන රටාව පදනම් කරගත් ක්‍රමවේදයයි.
(5) එඩ්ගා ඩෙගාගේ චලනය සහිත අවස්ථා නිරූපණ ක්‍රමවේදයයි. (………)

**40.** මෙම සිතුවමින් මතු වී පෙනෙන දෘශ්‍ය ප්‍රකාශනය වනුයේ,
(1) සිද්ධි නිරූපණය මගින් පිළිබිඹු වන රාජ මාලිගයක විසිතුරු බවයි.
(2) ආගමික සිද්ධියක් නිරූපණය කිරීමට වඩා ලෞකිකත්වය චිත්‍රය තුළින් මතු කිරීමයි.
(3) සවිස්තරාත්මක නිරූපණයත් ඉන්දීය සමාජ ලක්ෂණත් පිළිබිඹු වීමයි.
(4) රාජකීය සාම්ප්‍රදායික චාරිත්‍ර ගාම්භීර ආකාරයෙන් විදහා දැක්වීමයි.
(5) මානව රූව හා ඇඳුම්-පැළඳුම් මගින් විදේශීය බවක් පිළිබිඹු වීමයි. (………)

**



සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

නව නිර්දේශය / புதிய பாடத்திட்டம் / New Syllabus

NEW

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2019 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2019 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2019

චිත්‍ර කලාව I
சித்திரக்கலை I
Art I

51 S I

## II කොටස

* මෙම කොටස අනුකොටස් **තුනකින්** සමන්විත ය.
* '**අ**' කොටසින් ප්‍රශ්න දෙකක් හා '**ආ**' සහ '**ඉ**' යන කොටස් දෙකෙන් **එක්** ප්‍රශ්නය බැගින් තෝරාගෙන, ප්‍රශ්න **හතරකට** පිළිතුරු සපයන්න.
(අවශ්‍ය තැන්හි පිළිතුරු සචිත්‍ර කිරීම ඔබට වාසිදායක වේ.)

### 'අ' කොටස
### (චිත්‍ර කලාව ඇගයීම හා රසාස්වාදය - ශ්‍රී ලංකාව)

**1.** ශ්‍රී ලාංකේය විහාර බිතුසිතුවම් කලාවේ හැරවුම් ලක්ෂ්‍යයක් සනිටුහන් කළ බොරැල්ලේ ගෝතමී විහාරයේ හා කැලණියේ නව විහාරයේ සිතුවම් ශෛලීන් දෙකක් මෙන්ම සම්ප්‍රදායයන් දෙකක් නියෝජනය කරයි.

(i) කැලණියේ නව විහාරයේ චිත්‍ර අතුරෙන් බුද්ධ චරිතය නිරූපිත චිත්‍රයක් හා ඓතිහාසික චිත්‍රයක් නම් කරන්න. (ලකුණු 2 යි.)

(ii) ජෝර්ජ් කීට්, ගෝතමී විහාරයේ චිත්‍රකරණය සඳහා තෝරා ගත් තේමා නිරූපණය කර ඇති අයුරු කෙටියෙන් පහදන්න. (ලකුණු 5 යි.)

(iii) ශෛලීය සහ වර්ණ භාවිතය ආශ්‍රයෙන් බොරැල්ලේ ගෝතමී විහාරයේ හා කැලණියේ නව විහාරයේ චිත්‍ර පිළිබඳව සන්සන්දනාත්මක ඇගයීමක් කරන්න. (ලකුණු 8 යි.)

**2.** ගම්පොළ යුගය මෙරට වාස්තු විද්‍යා නිර්මාණයන්ගේ පෙරළිකාර යුගය ලෙස හැඳින්විය හැකි ය.

(i) ගම්පොළ යුගයේ වාස්තු විද්‍යාඥයින් **දෙදෙනෙක්** නම් කරන්න. (ලකුණු 2 යි.)

(ii) ලංකාතිලක විහාරයේ වාස්තු විද්‍යා ලක්ෂණ කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 5 යි.)

(iii) "ඇම්බැක්කේ දේවාලය ගම්පොළ යුගයේ බිහි වූ විශ්මිත වාස්තු විද්‍යා නිර්මාණයක් සේම අගනා කැටයමින් යුතු කලාගාරයකි." සාකච්ඡා කරන්න. (ලකුණු 8 යි.)

**3.** අනුරපුර යුගයේ සහ පොළොන්නරුව යුගයේ දී ආගමික හා රාජකීය ගොඩනැගිලි ආශ්‍රිත කලා නිර්මාණ ක්‍රමිකව විකාශනය වී ඇත.

(i) අනුරාධපුර යුගයේ හා පොළොන්නරු යුගයේ ඉදිකරන ලද පඩිමාසර **එක** බැගින් නම් කරන්න. (ලකුණු 2 යි.)

(ii) නිල්ලක්ගම බෝධිඝරයේ වාස්තු විද්‍යාත්මක ලක්ෂණ කෙටියෙන් පහදන්න. (ලකුණු 5 යි.)

(iii) අනුරාධපුර සහ පොළොන්නරු යුගවල දක්නට ලැබෙන මුරගල සහ සඳකඩ පහන පිළිබඳ තුලනාත්මක ඇගයීමක් කරන්න. (ලකුණු 8 යි.)

More Past Papers at
tamilguru.lk

## 'ආ' කොටස

## (චිත්‍ර කලාව ඇගයීම හා රසාස්වාදය - ඉන්දියාව)

**4.** මහායාන බුදුදහම වැළඳගත් කුෂාණයින්ගේ අනුග්‍රහයෙන් ඇරඹි ගන්ධාර කලාව, විදේශීය කලා සම්ප්‍රදායන්ගේ සම්මිශ්‍රණයෙන් බිහි වූ බෞද්ධ කලාවකි.

(i) ගන්ධාර ශිල්පියා අතින් බිහි වූ හිඳි පිළිමයක් හා කැටයමක් නම් කරන්න. (ලකුණු 2 යි.)

(ii) 'හෝර්ට්මන්දාර්' පිළිමය ගැන කෙටි හැඳින්වීමක් කරන්න. (ලකුණු 5 යි.)

(iii) "ගන්ධාර බුදු පිළිම ආරම්භය කෙරෙහි බලපෑ විදේශීය ආභාසය, සමකාලීන ගුරුකුලයක් වූ මථුරා ශිල්පීන් තුළ දක්නට නොලැබිණ." උදාහරණ සහිත ව පහදන්න. (ලකුණු 8 යි.)

**5.** පල්ලව අධිරාජ්‍යය ආක්‍රමණය කළ චෝළයින් විසින් එම වාස්තු විද්‍යාව හා මූර්ති කලාව තව දුරටත් පවත්වා ගෙන ගිය නමුදු පසුව චෝළ නිර්මාණයන්හි පල්ලව හා චෝල කලා ලක්ෂණ සම්මිශ්‍රව දක්නට ලැබිණ.

(i) පල්ලව කලා සම්ප්‍රදායට අයත් වාස්තු විද්‍යා ශිල්ප ක්‍රම **දෙකක්** නම් කරන්න. (ලකුණු 2 යි.)

(ii) ගල්තලාවේ ස්වභාවික පිහිටීම 'ආකාශ ගංගාවරෝහණ' කැටයම සඳහා කලාකරුවා තාක්ෂණිකව භාවිත කළ ආකාරය කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 5 යි.)

(iii) පල්ලව හා චෝළ වාස්තු විද්‍යා නිර්මාණ එක බැගින් නම් කර, ඒවායේ නිර්මාණ ආකෘතිය සහ ව්‍යුහය සසඳමින් විග්‍රහ කරන්න. (ලකුණු 8 යි.)

## 'ඉ' කොටස

## (චිත්‍ර කලාව ඇගයීම හා රසාස්වාදය - යුරෝපය)

**6.** 20 වැනි සියවසේ බිහි වූ කලා ආරයන් අතර ඝනිකවාදයෙන් පසු බිහි වූ නව කලා ආරය වියුක්තවාදයයි.

(i) වියුක්තවාදී ශිල්පියෙක් හා කලා කෘතියක් නම් කරන්න. (ලකුණු 2 යි.)

(ii) "ජෝර්ජස් බ්‍රාක් ඝනිකවාදය ඇරඹීමේ පුරෝගාමියා ය." කෙටියෙන් පහදන්න. (ලකුණු 5 යි.)

(iii) ඝනිකවාදය හා වියුක්තවාදය අතර දක්නට ලැබෙන මූලික වෙනස්කම් **හතරක්** උදාහරණ සහිතව පහදන්න. (ලකුණු 8 යි.)

**7.** ග්‍රීක ශෛලිය අනුකරණය කරමින් පෝෂණය වූ රෝම කලාව යුරෝපයේ නව සංස්කෘතියක් බිහි කිරීමට සමත් විය.

(i) ග්‍රීක සම්භාව්‍ය යුගයේ මූර්ති **දෙකක්** නම් කරන්න. (ලකුණු 2 යි.)

(ii) ජුලියස් සීසර් උඩුකය මූර්තිය රෝම ශිල්පීන් අතින් බිහි වූ අගනා නිර්මාණයකි. එහි කලා ලක්ෂණ කෙටියෙන් පහදන්න. (ලකුණු 5 යි.)

(iii) ග්‍රීක 'හර්මීස් සහ ඩයොනීසියස්' මූර්තිය හා රෝම 'ඔගස්ටස්' මූර්තිය අතර සමානකම් **දෙකක්** සහ අසමානකම් **දෙකක්** පැහැදිලි කරන්න. (ලකුණු 8 යි.)

***

AL/2019/51/S-II(NEW)

සියලු ම හිමිකම් ඇවිරිණි /முழுப் பதிப்புரிமையுடையது /All Rights Reserved]

නව නිර්දේශය/புதிய பாடத்திட்டம்/New Syllabus

NEW

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2019 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2019 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2019

චිත්‍ර කලාව II
சித்திரக்கலை II
Art II

51 S II

2019.08.09 / 0830 - 1140

පැය තුනයි
மூன்று மணித்தியாலம்
Three hours

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time - 10 minutes

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.

**උපදෙස්:**

- ඔබේ **විභාග අංකය**, ඔබ චිත්‍රය අඳින කඩදාසියේ **පසුපිටේ** පැහැදිලි ව ලියන්න.
- ඔබ වෙත සපයා ඇති විශේෂ **අඳින කඩදාසිය** (Drawing paper) වර්ණ චිත්‍රය ඇඳීම සඳහා භාවිත කරන්න. වෙනත් කිසිම චිත්‍රයක් හෝ අධ්‍යයන සටහනක් ඇඳීම අවශ්‍ය නොවේ.
- උත්තර පත්‍රය විභාග ශාලාධිපතිට භාර දෙන විට එය වියළී තිබීම වැදගත් ය. තෙත් චිත්‍ර එකිනෙකට ඇලීමට ඉඩ ඇති බැවින්, එය ඔබට අවාසි විය හැකි ය.

**ස්වාභාවිකත්ව අධ්‍යයනය හා නිශ්චල ද්‍රව්‍ය සම්පිණ්ඩනය**

පහත සඳහන් කරුණු සැලකිල්ලට ගෙන ඔබ ඉදිරියේ තබා ඇති ද්‍රව්‍ය සමූහය ඇඳ, වර්ණ කරන්න.

* කඩදාසි තලය, අර්ථවත් ව භාවිත කරමින් චිත්‍රය සම්පිණ්ඩනය කරන්න.

* ද්‍රව්‍යවල ගතිලක්ෂණ, මතුපිට ස්වභාවය, පරිමාණය, ඇස් මට්ටම, ත්‍රිමාණ ලක්ෂණ හා පර්යාලෝක රීති පිළිබඳ ව සැලකිලිමත් වන්න.

* ද්‍රව්‍ය සමූහය ඔබට පෙනෙන ආකාරයට ඇඳ, ඒ මත ආලෝකය හා අඳුර පතිත වී ඇති අයුරු සැලකිල්ලට ගෙන වර්ණ කරන්න.

* වර්ණ මාධ්‍යය හැසිරවීමේ ශිල්ප ක්‍රම අර්ථවත් ව භාවිත කරන්න.

* ද්‍රව්‍ය සමූහයට ගැළපෙන පරිදි වර්ණවත් පසුබිමක් යොදන්න.

* ද්‍රව්‍ය සමූහය තබා ඇති ලෑල්ලේ පරිමාණය ද්‍රව්‍ය සම්පිණ්ඩනයට ගැළපෙන පරිදි වෙනස් කරගැනීමට හැකි ය.

* දිය සායම්, පෝස්ටර් සායම්, කුඩු සායම්, පැස්ටල් හෝ මෙම මාධ්‍යය මිශ්‍රිත ව හෝ භාවිත කළ හැකි ය.

* * *

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

(නව නිර්දේශය/புதிய பாடத்திட்டம்/New Syllabus)

NEW

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம் இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2019 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2019 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2019

| | |
|---|---|
| චිත්‍ර කලාව | III |
| சித்திரம் | III |
| Art | III |

51 S III

2019.08.13 / 0830 - 1140

පැය තුනයි
மூன்று மணித்தியாலம்
*Three hours*

| | | |
|---|---|---|
| අමතර කියවීම් කාලය | - | මිනිත්තු 10 යි |
| மேலதிக வாசிப்பு நேரம் | - | 10 நிமிடங்கள் |
| Additional Reading Time | - | 10 minutes |

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේ දී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.

**උපදෙස්:**

* පහත සඳහන් 'අ', 'ආ' සහ 'ඉ' යන කොටස් තුනෙන් **එක්** මාතෘකාවක් පමණක් තෝරාගෙන, වර්ණ චිත්‍රයක් නිර්මාණය කරන්න.
* ඔබේ **විභාග අංකය** හා තෝරාගත් **ප්‍රශ්න අංකය** ඔබ චිත්‍ර අඳින කඩදාසියේ **පසුපිටේ** පැහැදිලි ව ලියන්න.
* චිත්‍රය භාර දෙන විට, එය වියළී තිබීම වැදගත් ය. තෙත් චිත්‍ර එකිනෙකට ඇලීමට ඉඩ ඇති බැවින් එය ඔබට අවාසි විය හැකි ය.
* ඕනෑ ම වර්ණ මාධ්‍යයක් හෝ මාධ්‍ය කිහිපයක් හෝ මිශ්‍රිත ව හෝ භාවිත කළ හැකි ය. (දිය සායම්, පෝස්ටර් සායම්, කුඩු සායම්, පැස්ටල් යන මාධ්‍ය මිශ්‍රිත ව භාවිත කිරීමට නිදහස ඇත.)
* ටිෂූ කඩදාසි අවශ්‍ය අයට සපයනු ලැබේ.

### 'අ' කොටස - චිත්‍ර සංරචනය

**1.** රාත්‍රී ආගමික උත්සව අවස්ථාවක්

**2.** සන්ධ්‍යාවේ මුහුදු වෙරළක විනෝදවන පිරිසක්

**3.** ගමේ සතිපොළක් හෝ නාගරික වෙළඳපොළක්

**4.** වන සතුන් සැරිසරන වනෝද්‍යානයක චාරිකාවේ යෙදෙන පිරිසක්

More Past Papers at
tamilguru.lk

### 'ආ' කොටස - මෝස්තර නිර්මාණය

**5.** කුඩා දරුවන්ගේ භාවිතයට සුදුසු රෙද්දක් මුද්‍රණය සඳහා උචිත ව්‍යාප්ත මෝස්තරයක් නිර්මාණය කරන්න. (ව්‍යාප්තිය දැක්වීම අනිවාර්ය වේ.)

**6.** සම්ප්‍රදායික සැරසිලි මෝස්තර ඇසුරෙන් කුෂන් කවරයකට සුදුසු අඟල් $9 \times 9$ ප්‍රමාණයේ මුලුතල මෝස්තර නිර්මාණයක් කරන්න.

**7.** විසිත්ත කාමරයකට සුදුසු අඩි $8 \times 6$ ප්‍රමාණයේ නූතන බිතු කැටයමක් නිර්මාණය කරන්න. (කඩදාසි තලයට ගැළපෙන පරිදි කුඩා කරන්න.)

### 'ඉ' කොටස - ග්‍රැෆික් චිත්‍ර නිර්මාණය

**8.** 'සමාජ සංහිඳියාව' නිරූපිත විචිත්‍රවත් පෝස්ටරයක් සැලසුම් කරන්න.

**9.** ජනප්‍රිය චිත්‍ර ශිල්පියකු පිළිබඳ ලියැවුණු පොතකට සුදුසු පිටකවරයක් සැලසුම් කරන්න. (මුල්පිටුව, සනකම සහ පසුපිටුව ඇතුළත් විය යුතුය.)

**10.** ශ්‍රී ලංකාවෙන් අපනයනය කෙරෙන තේ පැකට්ටුවකට උචිත සැලැස්මක් නිර්මාණය කරන්න. (ප්‍රමාණය හා හැඩය අභිමත පරිදි තීරණය කරන්න.)

* * *